# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 18 දරන නිවාස (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

(1974 ජූනි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 18 දරන නිවාස (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 47/73.

යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා ජාතික නිවාස කොමසාරිස් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ පළාත් පාලන කොමසාරිස් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ සපයන ලද ස්ථානයක පදිංචිය අනවසරයෙන් පැවරීම තහනම් කිරීම සඳහා ද එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 18 දරන නිවාස (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "කොමසාරිස්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික නිවාස කොමසාරිස් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ පළාත් පාලන කොමසාරිස් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා සපයන ලද ස්ථානයන්හි පදිංචිය ගෙවල් කුලී ගෙවා හෝ නොගෙවා දැරුව ද මේ පනතේ විධිවිධාන එකී සියලුම ස්ථාන සම්බන්ධයෙන් අදාළ වන නමුදු 1969 අංක 7 දරන ආණ්ඩුවේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ අර්ථානුකූල වූ ආණ්ඩුවේ නිවාස සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය. — පනත අදාළ වීම.

3. (1) අන් කිසි නීතියක කුමක් සඳහන් ව තිබුණ ද උචිත බලධරයා විසින් 2 වන වගන්තියේ සඳහන් යම් ස්ථානයක පදිංචිය සපයන ලද්දේ යම් තැනැත්තකු සඳහා ද එකී තැනැත්තා විසින්, උචිත බලධරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැති ව හා උචිත බලධරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසි අනුව හැර එකී ස්ථානයෙහි පදිංචිය අන් කිසි තැනැත්තකුට නොපැවරිය යුතුය. — පදිංචිය පැවරීම පිළිබඳ සීමා.

(2) මේ වගන්තියෙහි "උචිත බලධරයා" යන යෙදුමෙන්—

(අ) කොමසාරිස් විසින් සපයන ලද යම් ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට කොමසාරිස් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයෙක් අදහස් වේ;

(ආ) පළාත් පාලන ආයතනයක් විසින් සපයන ලද යම් ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට, අවස්ථාවෝචිත පරිදි, එය මහා නගර සභාවක් වූයේ නම් මහා නගර සභා කොමසාරිස් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයෙක් හෝ, එය නගර සභාවක් හෝ සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් හෝ වූයේ නම් එහි සභාපති හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයෙක් අදහස් වේ;

ඒ 06828—12939 (74/05)

(ඈ) පළාත් පාලන කොමසාරිස් විසින් සපයන ලද යම් ස්ථාන යක් සම්බන්ධයෙන් වූ විට පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද නිලධර යෙක් අදහස්වේ; තව ද

(ඇ) රාජ්‍ය සංස්ථාවක් විසින් සපයන ලද යම් ස්ථානයක් සම්බන්ධ යෙන් වූ විට එකී සංස්ථාවේ ප්‍රධානයා හෝ ඔහු විසින් ලිය විල්ලකින් බලය පවරන ලද නිලධරයෙක් අදහස්වේ.

නියෝග.

4. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක වන්නේ ය.

(3) (අ) පළාත් පාලන ආයතනයක් විසින් සපයන ලද යම් ස්ථානයක්, හෝ

(ආ) පළාත් පාලන කොමසාරිස් විසින් සපයන ලද යම් ස්ථානයක්

සම්බන්ධයෙන් නියෝග සාදනු ලබන අවස්ථාවක එකී නියෝග පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව සාදනු ලැබිය යුතුය.

(4) සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබී මෙන් පසු හැකි ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබේ. එහෙත් එය යටතේ කලින් කරන ලද දෙය කට ඉන් හානියක් නොවන්නේ ය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතුය.

වැරදි හා දණ්ඩන.

5. මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට හෝ සති හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාර යක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේ ය.

අර්ථ නිරූපණය.

6. මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස—

"ගොඩනැගිල්ල" යන්නට තට්ටු නිවාසයක් ද ඇතුළත් වේ;

"තට්ටු නිවාසය" යන්නෙන් එක් තට්ටුවකට වැඩි ගොඩනැගිල්ලක අංග සම්පූර්ණ ගෘහ්‍ය කාමර කට්ටලයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම්සභාවක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ආධාරයක් හෝ ණයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන්, සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතියකින් හෝ එවැන්නක් යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ; තව ද

"ස්ථානය" යන්නෙන් ගොඩනැගිල්ලකට හෝ ගොඩනැගිල්ලක කොටසකට අයත් ඉඩම සමග එකී ගොඩනැගිල්ල හෝ කොටස අදහස් වේ.